# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 78 /2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 16/01/2024<br>පැය 1235 |

## මාධ්‍ය නිවේදනය

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.**

**01. 2024.01.15 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 07 | 07 | 198 | 360 | යකඩ බැරල් 02<br>ප්ලාස්ටික් බැරල් 02<br>තඹ දඟර 01<br>ගෑස් සිලින්ඩර් 01 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථාන වෙත ඉදිරිපත් කර ඇත.

**02. තීරුබදු නොගෙවා නීති විරෝධීව මෙරටට ගෙන්වන ලද දුම්වැටි සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුර.**

2024.01.16 වන අද දින අළුයම් කාලයේ මීගමුව පොලිස් වසමේ පෙරියමුල්ල ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **තීරුබදු රහිතව මෙරටට ගෙන්වන ලද නීති විරෝධි දුම්වැටි 3800ක්** සමඟ **සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන මීගමුව පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 21 ක් වූ සිලාවතුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. මීගමුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03.** **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමග සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කන්තලේ කඳවුර.**

2024.01.15 වන දින උදෑසන කාලයේ සේරුනුවර පොලිස් වසමේ අරියමංකේනි ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා කන්තලේ කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමග** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන සේරුනුවර පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 66 ක් වූ අරියමංකේනි ප්‍රදේශයේ පදිංචිකරුවෙකි. සේරුනුවර පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.**

**04.** **බලපත්‍ර නොමැතිව වැලි කැණීම් කර ලොරි රථයකට වැලි පටවමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා සමන්තුරය කඳවුර.**

2024.01.15 වන දින උදෑසන කාලයේ සමන්තුරය පොලිස් වසමේ නෛනකාඩු ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා සමන්තුරය කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **බලපත්‍ර නොමැතිව වැලි කැණීම් කර ලොරි රථයකට පටවමින් සිටි** සැකකරුවෙකු ලොරි රථය සමග අත්අඩංගුවට ගෙන සමන්තුරය පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 35 ක් වූ සමන්තුරය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි. සමන්තුරය පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.